මානව සම්පත් අභිවර්ධන ආයතනය - 2016
----------------------------------------------

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත මානව සම්පත් අභිවර්ධන ආයතනයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සහ 18 වන වගන්තිය යටතේ පනවා ඇති 1979 අංක 11 දරන මානව සම්පත් අභිවර්ධන ආයතන නියමාවලියේ 23 වගන්තිය හා විශ්වවිද්‍යාල පනතේ 108(1) සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම
---------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම
--------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.**

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**2.1** **තත්ත්වාගණනය කළ මතය**

**මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත මානව සම්පත් අභිවර්ධන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.**

**2.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1** **ගිණුම්කරණ අඩුපාඩු**

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

**(අ)** **ආයතනයේ කෙටිකාලීන පාඨමාලා සඳහා පවත්වාගෙන යන බැංකු ගිණුමෙහි වූ දීර්ඝ කාලීනව හඳුනා නොගත් රු.3,996,475 ක තැන්පතු, ආදායම් ප්‍රභවය හඳුනාගැනීමකින් තොරව උපචිත වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.**

**(ආ)** **කාර්ය මණ්ඩල ණය සහ අත්තිකාරම් හා ගෙවිය යුතු දෑ යන වටිනාකම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණි.**

**2.2.3** **විගණනය සඳහා සාක්ෂි නොවීම**

**මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ රු.52,995,480 ක් වූ ස්ථාවර වත්කම්වල වටිනාකම තහවුරු කර ගැනීම සඳහා ස්ථාවර වත්කම් ලේඛනය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.**

**2.3** **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**ජ්‍යෙෂ්ඨ ආචාර්යවරයෙකුට ලබාදී තිබුණු රු.191,100 ක් හා නිලධාරියෙකුට ලබාදී තිබුණු රු.84,944 ක ණය ශේෂ පිළිවෙලින් වසර 13 ක් හා වසර 06 ක් ගතවී තිබුණද අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.**

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති රීති , රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය | |
| | (i) I පරිච්ඡේදයේ 2.2 වගන්තිය | අතිකාල සේවයේ යෙදීම වෙනුවෙන් ගෙවීම් කිරීමේදී ආයතන සංග්‍රහයේ දක්වා ඇති පරිදි ගෙවීම් කිරීම වෙනුවට ස්ථාවර දීමනාවක් ලබාදීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 325,283 ක් වැඩිපුර ගෙවා ඇති බව නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. |
| | (ii) XX පරිච්ඡේදයේ 3.1 හා 3.2 වගන්ති | ආයතනයේ අධ්‍යයන හා අනධ්‍යයන සියළුම නිලධාරීන් පැමිණීම හා පිටවීමේ වේලාවන් සටහන් කළ යුතු වුවත් අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 06 දෙනෙකුගේ පැමිණීම සනාථ කරගැනීමෙන් තොරව රු.14,519,885 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 756 | 2016 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. |
| (ඇ) | 2015 ජුනි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | අදාළ කාර්යය නිමකළ විගසම අත්තිකාරම් පියවිය යුතු වුවත් අවස්ථා 05 කදී ලබාගෙන තිබූ එකතු වටිනාකම රු.44,925 ක අත්තිකාරම් පියවීම සඳහා දින 60 සිට දින 110 ක් දක්වා කාලයක් ගතවී තිබූ අතර අවස්ථා 08 කදී ලබාගෙන තිබූ එකතු වටිනාකම රු.115,381 ක් වූ අත්තිකාරම් 2017 ජනවාරි 24 දින වනවිටත් පියවා නොතිබුණි. |
| (ඈ) | 2004 ජුලි 29 දිනැති අංක පීඊඩී/25 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | රාජ්‍ය ව්‍යාපාර සතු මුදල් ආයෝජනය සම්බන්ධයෙන් භාණ්ඩාගාර අනුමැතිය ලබාගත යුතු වුවත් 2015 වර්ෂයේ රු.මිලියන 89.5 ක් හා 2016 වර්ෂයේ රු.මිලියන 40 ක් වටිනා ආයෝජන සම්බන්ධයෙන් භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබු බව විගණනයේදී නිරීක්ෂණය විය. |

| | | |
|---|---|---|
| (ඉ) | 1995 ජූලි 14 දිනැති අංක 636 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | විභාගය පැවැත්වූ දින සිට මාස 03 ක කාලයක් ඇතුළත විභාග ප්‍රතිඵල නිකුත් කළ යුතු වුවත් ඊට පටහැනිව ආයතනය විසින් 2015 හා 2016 වර්ෂ තුළදී පවත්වන ලද විභාග 05 ක ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා මාස 05 ත් මාස 07 ත් අතර කාලයක් ගත කර තිබුණි. 2016 ජුනි මාසයේදී පවත්වා තිබූ විභාගයක ප්‍රතිඵල විගණිත දිනය වූ 2017 ජුනි 30 දක්වාම නිකුත් කර නොතිබුණි. |

3. මූල්‍ය සමාලෝචනය
-----------------------

3.1 මූල්‍ය ප්‍රතිඵල
---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.61,576,424 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.24,437,356 ක් වූයේ ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.37,139,068 කින් වර්ධනය වී තිබුණි. විස්තාරිත පාඨමාලා සඳහා වන වියදම් රු. 33,437,619 කින් අඩුවීම සහ වෙනත් ආදායම් 2,112,639 කින් වැඩිවීම ඉහත වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

2012 වර්ෂයේ රු.19,061,471 ක් වූ ආයතනයේ අතිරික්තය 2014 වර්ෂය අවසානයට රු.11,340,232 ක් දක්වා අඩුවී තිබුණද ඉන්පසු වර්ෂවලදී ක්‍රමයෙන් වර්ධනය වී සමාලෝචිත වර්ෂයේදී රු.576,424 ක්වී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිතෝෂික ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේදී 2012 වරශයේ රු.49,124,600 ක් වූ දායකත්වය 2014 වර්ෂය අවසානයට රු.47,458,572 ක් දක්වා අඩුවී තිබුණද සමාලෝචිත වර්ෂය අවසානයට රු.104,774,561 ක් දක්වා වර්ධනය වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය
---------------------------

4.1 කාර්යසාධනය
---------------

ඉහළ ගුණත්වයෙන් යුතු අධ්‍යයන පාඨමාලා ප්‍රදානය තුළින් විශිෂ්ඨත්වයට පත්වීම, අධ්‍යයන පාඨමාලා කළමනාකරණය කිරීම තුළින් විශිෂ්ඨත්වයට පත්වීම, ආයතනය තුළ පර්යේෂණ සහ සංවර්ධන වටපිටාවක් නිර්මාණය කිරීම, ජාතික සංවර්ධනයට දායකවීම සඳහා පෞද්ගලික අංශය හා උපාය මාර්ගික සම්බන්ධතා ගොඩනගා ගැනීම, විශිෂ්ඨ ඵලදායී පරිපාලන ක්‍රියාමාර්ග අනුගමනය කිරීම තුළින් විශිෂ්ඨත්වයට පත්වීම, විශ්වවිද්‍යාලය තුළ හරිත පරිසරයක් ගොඩනැගීම තුළින් විශිෂ්ඨත්වයට පත්වීම සහ සිත්ගන්නා සුළු ඉගැන්වීම්, අධ්‍යයන හා පරිපාලන වටපිටාව තුළින් විශිෂ්ඨත්වයට පත්වීම යන කරුණු ආයතනයේ අරමුණු වුවද, එම අරමුණු ඉටුකරගැනීම සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත්ව තිබූ ක්‍රියාකාරකම් 16 ක් අතුරින් ක්‍රියාකාරකම් 02 ක් පමණක් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර තිබූ බව නිරීක්ෂණය විය.

ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් අපේක්ෂිත ක්‍රියාකාරකම්වල ප්‍රගතිය තහවුරු කර ගැනීමට ප්‍රමාණවත් පරිදි ආයතනය විසින් සමාලෝචිත වර්ෂයේ අවසානයට කාර්යසාධන වාර්තාව ඉදිරිපත්කර නොතිබුණි.

**4.2** කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය විසින් 2014 වර්ෂයේදී මාධ්‍ය සහ ශ්‍රව්‍ය දෘශ්‍ය නිර්මාණ උසස් ඩිප්ලෝමා පාඨමාලාව ආරම්භ කර තිබුණද මෙම පාඨමාලා පැවැත්වීම සඳහා ආයතනයේ විශේෂඥ දැනුමක් ඇති ආචාර්යවරුන් නොසිටි බැවින් 2014 වර්ෂයෙන් පසු පාඨමාලාව සඳහා සිසුන් බඳවාගෙන නොතිබුණි.

(ආ) 2014 ජුනි මස 01 දින කොළඹ විශ්වවිද්‍යාලයේ නව කලාගාරයේ පැවති ඩිප්ලෝමා සහතික ප්‍රදානෝත්සවය සඳහා භාවිතා කරන ලද ආයතනයට අයත් රු.69,900 ක් වටිනා ලැප්ටොප් පරිගණකයක් අස්ථානගත වී තිබු අතර ඒ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පවත්වා ආයතනයට සිදු වූ අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ආයතනයෙහි පරිපාලන හා අධ්‍යයන කටයුතු සඳහා ඉදිකර තිබූ ගොඩනැගිල්ල පිහිටි පර්චස් 27.86 ක් වූ ඉඩම කොළඹ විශ්වවිද්‍යාලය සතු වන අතර එම ඉඩමෙහි අයිතිය පවරා ගෙන වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

**4.3** මෙහෙයුම් ක්‍රියාකාරකම්

2016 මාර්තු මාසයේදී රු. 10,000,000 ක් සියයට 4.5 ක පොලී අනුපාතයක් මත සත්දින තැන්පතුවක ආයෝජනය කර තිබුණද එය 2017 ජුනි දක්වාම එලෙසම පවත්වාගෙන ගොස් තිබුණි. මෙම මුදල වසරක කාලයක් සඳහා එදිනට පැවති සියයට 8.25 ක වාර්ෂික පොලී අනුපාතය යටතේ ස්ථාවර තැන්පතුවක ආයෝජනය කළේ නම් ආයතනයට රු.825,000 ක පොලී ආදායමක් උපයාගැනීමට හැකිව තිබු අතර කෙටිකාලීනව ආයෝජනයේ යෙදවීම හේතුවෙන් ආයතනයට රු. 375,000 ක පමණ පොලී ආදායමක් අහිමි වී තිබුණි.

**4.4** නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2011 වර්ෂයේදී මාධ්‍ය විද්‍යාගාරයක් (Media Lab) ආරම්භ කර තිබූ අතර ඒ සඳහා 2011 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාල සීමාව තුළ රු.10,425,293 ක් වටිනා උපකරණ සහ සමාලෝචිත වර්ෂයේදී රු.14,378 ක් වටිනා ලියන මේසයක් විද්‍යාගාරය සඳහා මිලදී ගෙන තිබුණි. එහෙත් මෙම විද්‍යාගාරය 2011 වර්ෂයේ සිටම භාවිතයට ගෙන නොතිබූ අතර එම වත්කම් මිලදීගත් දින සිටම නිශ්කාර්යව පැවතුණි. විද්‍යාගාරය නිසි ලෙස පවත්වාගෙන යාමට හෝ එය ප්‍රයෝජනයට ගත හැකි පාඨමාලාවක් ලෙස පවත්වාගෙන යෑමට හැකි කුසලතාවයන්ගෙන් යුතු ස්ථිර කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමට ආයතනයට අවකාශයක් නොමැති බව ආයතනයේ අධ්‍යක්ෂවරයා විසින් 2017 ඔක්තෝබර් 04 දින දන්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයේ පැවති මුදල් හා කෙටිකාලීන ආයෝජන ශේෂයන්හි එකතුව රු.338,656,044 ක් වූ අතර එම ශේෂය තුළ වැය නොකළ ප්‍රාග්ධන ප්‍රදාන රු.23,723,718 ක් ඇතුළත්ව පැවතුණි. ඒ අනුව එම අරමුදල් ඵලදායී ලෙස ආයතනයේ අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් යොදවා ගැනීමකින් තොරව අඛණ්ඩව රඳවාගෙන තිබු බව නිරීක්ෂණය විය.

**4.5** හඳුනාගත් පාඩු

--------------------

සේවකයකු සඳහා අනුමත අර්ථසාධක අරමුදල් නොගෙවීම හේතුවෙන් අධිභාර ලෙස රු. 31,850 ක් ගෙවා තිබුණි.

**4.6** කාර්ය මණ්ඩල පරිපාලනය

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මානව සම්පත් අභිවර්ධන ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු සංඛ්‍යාව 97 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 67 ක් වුයෙන් පුරප්පාඩු සංඛ්‍යාව 30 ක් විය. ආයතනයේ කටයුතු නිසි පරිදි පවත්වාගෙන යාම සඳහා අවශ්‍යවන අධ්‍යයන කාර්ය මණ්ඩලයේ අනුමත කථිකාචාර්ය තනතුරු 09 න් තනතුරු 02 ක් පුරප්පාඩුව පැවතුණි.

(ආ) අනුමත කාර්ය මණ්ඩල තනතුරුවලට අදාළ පුරප්පාඩු සඳහා බඳවා ගැනීමකින් තොරව 2016 වර්ෂයේදී කොන්ත්‍රාත් පදනම මත වැඩසටහන් සහකාරවරුන් 19 දෙනෙක්ද කාර්යාල සහායක සහ සෞඛ්‍ය සේවා කම්කරු ලෙස සේවකයින් 21 දෙනෙකුද බඳවාගෙන තිබුණි.

**5.** ගිණුම්කටයුතු භාවය හා යහපාලනය

---------------------------------------------

**5.1** සංයුක්ත සැලැස්ම

------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව, ආයතනයේ දර්ශනය හා මෙහෙවර ඉටුකරගැනීම සඳහා වර්ෂ 03 කට නොඅඩු කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් සකස් කර එය කාලනුරූපීව සමාලෝචනය කර යාවත්කාලීන කළ යුතුය. එහෙත් මෙම ආයතනයේ සංයුක්ත සැලැස්ම 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා පිළියෙල කර තිබුණ ද එය යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි.

**5.2** ප්‍රසම්පාදන සැලැස්ම

-------------------------------

2016 වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ ප්‍රසම්පාදන සැලැස්මෙහි ඇතුළත් නොවූ අයිතමයන් 12 ක් රු.2,015,899 ක් වැයකර මිලදීගෙන තිබූ අතර ඒ අනුව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීමේදී ආයතනයේ අවශ්‍යතාවයන් පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය.

**6.** පද්ධති හා පාලනයන්

------------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් කළමනාකරණය | ස්ථාවර වත්කම් ලේඛනය පිළියෙල කර නොතිබීම හා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර නොතිබීම. |
| (ආ) | ආයෝජන කළමනාකරණය | ආයෝජන සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබානොගැනීම සහ අවශ්‍යතාවය සලකා බලා ආයෝජන සිදු නොකිරීම. |
| (ඇ) | ආදායම් කළමනාකරණය | පාඨමාලා ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත නොකිරීම. |
| (ඈ) | ගිණුම්කරණය | (i) කාර්ය මණ්ඩල අවශ්‍යතා අනුව අනුමත කාර්ය මණ්ඩල සංශෝධනය සහ පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීම.<br>(ii) පාඨමාලා ආදායම් නිවැරදිව වර්ගීකරණය කර ගිණුම්ගත නොකිරීම. |
| (ඉ) | සේවක ණය පාලනය | සේවක ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබීම. |